සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

ඉතිහාසය II (II කොටස)
வரலாறு II (பகுதி II)
History II (Part II)

25 - A S II

**ඉන්දියා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා**

**උපදෙස්:**

※ **පළමුවැනි** ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න **හතරකටත්** පිළිතුරු සපයන්න.
(**පළමුවැනි** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ඉන්දියාවේ දළ සිතියමක්** සපයා ඇත.)

## II කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.** ඒවායින් කැමති **දෙකක්** පිළිබඳ ව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.
   (i) තක්ෂිලා (ii) හරප්පා
   (iii) භාරුකච්ඡ (iv) සාංචි
   (v) වින්ධ්‍යා කඳුවැටිය (vi) තංජෝර්
   (vii) තාම්‍රලිප්ති (viii) කෘෂ්ණා ගඟ
   *(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි; කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 05 බැගිනි.)*

2. මොහෙන්ජෝදාරෝ-හරප්පා ශිෂ්ටාචාරයේ සමාජ, සංස්කෘතික හා ආර්ථික තත්ත්වයන් පැහැදිලි කරන්න. (ලකුණු 14යි.)

3. බ්‍රහ්මාවර්තයේ සිට ආර්යාවර්තයට ජනාවාස ව්‍යාප්ත වීමත් සමඟ සමාජ හා සංස්කෘතික අංශවල ඇති වූ වෙනස්කම් පරීක්ෂා කරන්න. (ලකුණු 14යි.)

4. මෞර්ය පාලන ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ සාකච්ඡා කරන්න. (ලකුණු 14යි.)

5. "කනිෂ්ක රජු කුෂාණ රාජ වංශයේ කැපීපෙනෙන නායකයා විය."
   (i) කනිෂ්කගේ අගනුවර කුමක් ද? (ලකුණු 01යි.)
   (ii) කුෂාණ සමයේ සිටි ප්‍රධාන පෙළේ බෞද්ධ භික්ෂූන් **දෙනමක්** නම් කරන්න. (ලකුණු 02යි.)
   (iii) ඉන්දියානු දේශපාලන ක්ෂේත්‍රයෙහිලා කුෂාණයන්ගේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 03යි.)
   (iv) "සංස්කෘතික හා ආගමික ක්ෂේත්‍රවල වර්ධනයට කනිෂ්ක රජුගෙන් සිදු වූ දායකත්වය කැපීපෙනේ."
   මෙම ප්‍රකාශය පරීක්ෂා කරන්න. (ලකුණු 08යි.)

6. ගුප්ත අධිරාජ්‍යය පිහිටීමට හා බිඳවැටීමට බලපෑ ප්‍රධාන සාධක කවරේ ද? (ලකුණු 14යි.)

7. "ගුප්තයන්ගෙන් පසු උතුරු ඉන්දියාව ප්‍රමුඛත්වයට පැමිණියේ හර්ෂවර්ධන රාජ්‍ය සමයේ දී ය."
   (i) හර්ෂවර්ධන රාජ්‍ය කාලය පිළිබඳ දැක්වෙන සාහිත්‍ය මූලාශ්‍රයක් නම් කරන්න. (ලකුණු 01යි.)
   (ii) ඔහුගේ රාජ්‍ය සමයේ දී බෞද්ධ සම්මේලන පැවැත්වූ ප්‍රධාන ස්ථාන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02යි.)
   (iii) ඔහු කනෞජයේ සිංහාසනයට පැමිණි ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03යි.)
   (iv) උතුරු ඉන්දියානු ආධිපත්‍යයේ මධ්‍යස්ථානය බවට කනෞජය පත්කිරීමෙහිලා හර්ෂවර්ධනගේ දායකත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 08යි.)

8. **එක්කෝ (A)** කොටසට **නැතහොත් (B)** කොටසට පමණක් පිළිතුරු සපයන්න.
   **(A)** ක්‍රි. ව. 7 හා 8 වන ශත වර්ෂවල දී බටහිර සහ වයඹදිග ඉන්දියාවට එල්ල වූ ආරාබි ආක්‍රමණ විචාරාත්මකව පරීක්ෂා කරන්න. (ලකුණු 14යි.)
   **(B)** පළමුවන රාජරාජ සහ පළමුවන රාජේන්ද්‍ර යටතේ චෝළ බල ව්‍යාප්තියේ ප්‍රධාන අවස්ථා ගෙනහැර දක්වන්න. (ලකුණු 14යි.)

9. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ සටහන් ලියන්න.
   (i) සෙලියුකස් නිකේටර් (ii) ගණ රාජ්‍ය
   (iii) සංගම් සාහිත්‍යය (iv) වයඹදිග ඉන්දියාවේ ශක පාලනය
   *(එක් සටහනකට ලකුණු 07 බැගිනි.)*

* * *

www.artsapi.lk